මුතූර් ප්‍රාදේශීය සභාව
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
---------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර පෙර වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දින ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභා ලේකම්වරයා වෙත යවා තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට මුතූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ඉතිරි කිරීම් තැන්පතු පොළී රු.17,729 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.34,717 ක් වශයෙන් දක්වා තිබුණි. ඒ හේතුකොට ගෙන ඉතිරි කිරීමේ ගිණුම් ශේෂය රු.16,988 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2015 වර්ෂයේදී ලී බඩු මිලදී ගැනීම සඳහා ගෙවන ලද රු. 493,845 ක මුදල අත්තිකාරම් වශයෙන් ගිණුම්වලට ගෙන තිබුණි.

(ඇ) ලෙජරයට අනුව හිඟ හිටි ආදායම රු.16,535,655 ක් විය. මූල්‍ය ප්‍රකාශනවල එය රු. 16,360,456 ක් වශයෙන් දක්වා තිබුණි. ඒ හේතුකොට ගෙන හිඟ ආදායම් රු.175,199 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම
-----------------------------------

රු.11,139,745 ක් වූ අත්තිකාරම් ශේෂයට අදාළ අත්තිකාරමේ ලේඛනය විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

1.3.3 නීති රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම
-------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහයේ X පරිඡේදයේ 193 වගන්තිය | වර්ෂයේ සත්‍ය ආදායම හා වියදම් විස්තර අයවැයගත ඇස්තමේන්තු සමඟ සසඳමින් විචලන ප්‍රකාශය විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | අවුරුදු 05 සිට 07 දක්වා කාල පරිච්ඡේදය තුළ පැවතෙන රු.452,617 ක්වූ ආදායම් තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

1.2 මූල්‍ය සමාලෝචනය

1.3 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.6,432,080 ක් වූ අතර, ඉකුත් වර්ෂය සමඟ සැසඳූවිට ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.3,128,510 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,303,570ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

1.4 ආදායම් පරිපාලනය

1.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

සභාව විසින් වාර්තා කරන ලද පරිදි, අයවැයගත ආදායම සහ තත්‍ය ආදායම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්‍ෂණය විය.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තත්‍ය ආදායම | 2016.12.31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 806 | 728 | 79 |
| ගෙවල් කුලී | 11,960 | 9,661 | 2,300 |
| සේවා ගාස්තු | 9,072 | 1,642 | 7,430 |
| අනෙකුත් ආදායම් | 51,882 | 42,656 | 9,226 |

1.4.2 වරිපනම් හා බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව 1984 සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා සභා බල ප්‍රදේශය තුළ වූ ඉඩම් ගොඩනැගිලි සහ ඉදිකළ නිවාසවලින් අයකළ යුතු එකතුව රු.5,299,182 ක්වූ වරිපනම් හා බදු අයකර නොතිබුණි.

1.4.3 කඩ කමරවලින් ලැබිය යුතු කුලී ආදායම්

2013 වර්ෂයේදී පුර නැඟුම අරමුදල් භාවිතා කර, රු.22,820,738 ක්වූ පිරිවැයකින් කඩ කාමර 40 කින් සමන්විත වෙළඳ සංකීර්ණයක් ඉදිකර තිබුණි. මේවා 2014 වර්ෂයේදී බදු දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 173 වගන්තිය ප්‍රකාරව ගිවිසුම්වලට එළඹ කඩ කාමර බදු දීම සිදුකළ යුතුව තිබුණි. එනමුත් කඩ කාමර 40 න් 33 ක් සඳහා බදු කාල පරිච්ඡේදයක් සඳහන් නොකර දීර්ඝ කාලීනව බදු ගිවිසුම්වලට එළඹ තිබුණි.

ii. 2014 ජනවාරි 01 සිට 2017 අගෝස්තු 17 විගණිත දින දක්වා වූ කාල සීමාව සඳහා ලැබිය යුතු රු.1, 292,000 ක් වූ බදුකුලී අයකර ගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි.

1.4.4 මස් කඩ බදු දීම

---------------------

වර්ෂ 5 ක් තිස්සේ රු.10,142,162 ක් වූ මස් කඩ හිඟ බදු කුලීය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

2.1 කළමනාකරණ අකර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) වෙනත් ආයතනවලින් පරිත්‍යාග වශයෙන් ලද මෝටර් වාහන 12ක් වසර 11 කට වැඩි කාලයක් තිස්සේ භාවිතා කරමින් තිබුණි. එනමුත් එම වාහන අත්පත් කර ගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1.6 සහ 4 වගන්ති ප්‍රකාරව සේවකයන් තිදෙනෙකුට රු.108,620 ක්වූ ණය ප්‍රදානය කර තිබුණි. ඉකුත් වසර 9 ක කාලයක් තුළ මෙම ණය අයකර නොගෙන හිඟව තිබුණි.

(ඇ) මෝටර් ප්‍රවාහන පනතේ 203 වගන්තිය ප්‍රකාරව සියලු වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබාගත යුතුවේ. එනමුත් සභාව විසින් භාවිතා කරන වාහන 09 ක් සඳහා එවැනි බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ඈ) බැංකුවක වසර 10 ක් තිස්සේ රු.55, 351 ක ශේෂයක් ඇති අක්‍රිය ජංගම ගිණුමක් වසා දැමීම සඳහා මේ දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඉ) යුනිසෙෆ් ආධාර යෝජනා ක්‍රමය යටතේ සාම්පූර්හි නැවත පදිංචි කරනු ලැබූ ප්‍රතිලාභීන් 200දෙනෙකුට ජලය සැපයීම සඳහා රු.2,090,980 ක් ගෙවා තිබුණි. 2016 දෙසැම්බර් 25 ගෙවීම් කර තිබු නමුත්, ප්‍රතිලාභීන් 47දෙනෙකු විසින් මේ දක්වා ජලය ලබාගෙන නොතිබුණි.

(ඊ) පළාත් මූල්‍ය රීති 163.3 ප්‍රකාරව අත්තිකාරම් දින 10 ක් තුලදී පියවිය යුතු වේ. එනමුත් වසර 01 සිට 03 දක්වා වූ කාල පරාසයක් තුළ ලබාගත් රු.15,627,645 ක්වූ අත්තිකාරම් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(උ) යුනිසෙෆ් අරමුදල් වෙන්කිරීම් යටතේ 2012 අගෝස්තු 22 දින සභාවට නිකුත් කරන ලද අපද්‍රව්‍ය සැකසුම් යන්ත්‍රය භාරදුන් දින පටන්ම භාවිතා කර නොතිබුණි. පාරිසරික දූෂණයට තුඩුදෙන අයුරින් සභා බල ප්‍රදේශය තුළ රැස්කෙරෙන මිනිස් මලපහ, කසළ බැහැර කරනු ලබන ස්ථානයටම බැහැර කරමින් තිබුණි.

3.2 නිෂ්ක්‍රිය සහා වත්කම්

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) සභාවට අයත් සී සෑමේ යන්ත්‍ර දෙකක් සහ පික්අප් රථයක් අළුත්වැඩියාකර භාවිතා කිරීමට හෝ බැහැර කිරීමට කටයුතු කර නොතිබුණි. වසර 02 සිට 09 දක්වා වූ කාලයක් තුළ ඒවා නිෂ්ක්‍රියව පැවතුණි.

(ආ) 2016 දෙසැම්බර් 07 දින පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු. 1,115,226 ක් වටිනා ජීව ගෑස් යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ගොඩනැගිල්ල කොන්ත්‍රාත්කරු විසින් ඉදිකර සභාව වෙත භාරදී තිබුණි. එනමුත් සැලසුම ක්‍රියාත්මක නොකර තිබු බැවින් ගොඩනැගිල්ල මේ දක්වා නිෂ්ක්‍රියව පැවතිණි.

(ඇ) දෙවන සෞඛ්‍ය අංශ වැඩසටහන යටතේ රු. 418,821 ක පිරිවැයකින් 2016 දෙසැම්බර් 31 දින තනවන ලද ළිං තුනක් මහජනයා ජීවත්වන ස්ථානයෙන් පිටත ළිං තනා ඇති බැවින් තනවන ලද දින සිට භාවිතයෙන් තොරව පැවතුණි.

3. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය අවශ්‍ය වේ.

| | පද්ධති හා පාලන | අවශ්‍ය අවධානය |
|---|---|---|
| | ------------------- | ---------------- |
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | I. ස්ථාවර වත්කම් ලේඛනයක් පැවැත්වීම.<br>II. සභාවට අයත් නිෂ්ක්‍රිය වත්කම් භාවිතා කිරීම සඳහා කටයුතු කිරීම |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය | I. කොන්ත්‍රාත් පිරිනැමීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීම<br>II. ප්‍රජා මධ්‍යස්ථාන වෙත කොන්ත්‍රාත් පිරිනැමීමේදී මුදල් කොමිසමේ චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව ක්‍රියාකිරීම. |